## මහනුවර මහා නගර සභාව

### මහනුවර මහා නගර සභාවේ මහජනාධාර දෙපාර්තමේන්තුවෙහි ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසල් ව්‍යාපෘතිය සඳහා ගුරුවරුන් බඳවා ගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත යෝජිත ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසල් ද්විත්වය සඳහා ප්‍රධාන පෙර පාසල් ගුරු හා සහායක පෙර පාසල් ගුරු තනතුරු 04කට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි තනතුරේ නාමය සඳහන් කර 2026.10.02 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

### ප්‍රධාන පෙර පාසල් ගුරු තනතුර

| | | |
|---|---|---|
| තනතුරු සංඛ්‍යාව | : | පාසල් දෙක සඳහා තනතුරු 02 |
| වයස | : | සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. |
| මාසික දීමනාව | : | මාසික දීමනාව රු. 37000/- කි |
| අධ්‍යාපන සුදුසුකම් | : | සිංහල හෝ දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් 02 (දෙකකට) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 (හයකින්) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම; *හා* අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් 01 (එකක්වත්) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි විෂය හැර) සමත්ව තිබීම. **සටහන** එම විභාගයන්හි දී චිත්‍ර කර්මය, සංගීතය, නැටුම් යන සෞන්දර්යය විෂයයන්ගෙන් සමත්ව තිබීම |
| වෘත්තීය සුදුසුකම් | : | පූර්ව පාඨශාලා අධ්‍යාපනය පිළිබඳ විවෘත විශ්වවිද්‍යාලයේ බාහිර සේවා මණ්ඩලය මඟින් නිකුත් කරන පූර්ව පාසල් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව; *හෝ* ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කර ඇති ආයතන මඟින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව; *හෝ* මධ්‍යම පළාත් සභාවේ මුල් ළමාවිය සංවර්ධන ඒකකය මඟින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව; *හෝ* තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමත ආයතන මඟින් පිරිනමනු ලබන පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව; **සටහන** මෙම ඩිප්ලෝමා පාඨමාලා කාල සීමාව අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩිවිය යුතුය |

**සහායක පෙර පාසල් ගුරු තනතුර**

| | | |
|---|---|---|
| තනතුරු සංඛ්‍යාව | : | පාසල් දෙක සඳහා තනතුරු 02 |
| වයස | : | සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. |
| මාසික දීමනාව | : | මාසික දීමනාව රු. 30000/- කි |
| අධ්‍යාපන සුදුසුකම් | : | සිංහල හෝ දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් 02 (දෙකකට) සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06 (හයකින්) අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්ව තිබීම;<br>*හා*<br>අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් 01 (එකක්වත්) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා ඉංග්‍රීසි විෂය හැර) සමත්ව තිබීම<br>**සටහන :**<br>එම විභාගයන්හි දී චිත්‍ර කර්මය, සංගීතය, නැටුම් යන සෞන්දර්යය විෂයයන්ගෙන් සමත්ව තිබීම |
| වෘත්තීය සුදුසුකම් | : | පූර්ව පාථශාලා අධ්‍යාපනය පිළිබඳ විවෘත විශ්වවිද්‍යාලයේ බාහිර සේවා මණ්ඩලය මඟින් නිකුත් කරන පූර්ව පාසල් අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමාව;<br>*හෝ*<br>ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ළමා ලේකම් කාර්යාලයට යටතේ ලියාපදිංචි කර ඇති ආයතන මඟින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව;<br>*හෝ*<br>මධ්‍යම පළාත් සභාවේ මුල් ළමාවිය සංවර්ධන ඒකකය මඟින් පිරිනමනු ලබන පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව<br>*හෝ*<br>තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමත ආයතන මඟින් පිරිනමනු ලබන පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමාව.<br>**සටහන**<br>මෙම ඩිප්ලෝමා පාඨමාලා කාල සීමාව අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩිවිය යුතුය |

**මෙම ගුරුවරියන් වසරක කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සිදුකරනු ලබන අතර එම කාලය අදාළ ගුරුවරිය සිදුකරනු ලබන සේවයේ ප්‍රවීණත්වය සැලකිල්ලට ලක්කර වසරින් වසර දීර්ඝ කිරීම සිදුකරනු ලැබේ.**

**(තනතුරු 2කටම අදාළව)**

1. විශේෂ සුදුසුකම් :

- මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.
- ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ඉහළ ඩිප්ලෝමාවක් හදාරා තිබීම විශේෂ සුදුසුකමක් වේ.
- ඉංග්‍රීසි භාෂාව චතුරව හැසිරවීමේ හැකියාව තිබිය යුතුය.
- අමතර සුදුසුකමක් වශයෙන් දෙමළ භාෂාව හා වෙනත් භාෂා පිළිබඳව ලබා ඇති දැනුම.

2. තෝරා ගැනීමේ ක්‍රමය : අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ.

3. කායික සුදුසුකම් : අදාළ සේවාව ලබා දීමට ප්‍රමාණවත් තරම් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4. වෙනත් සුදුසුකම් :

- අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
- බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- කාන්තා අයදුම්කරුවන් පමණක් අයදුම්කළ යුතුය.

*සටහන :-* මෙම සේවයේ යොදවා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුවේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

අයදුම්කරුවන් සිය අයදුම්පත් යොමු කරනු ලබන ලිපිකවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම්කරනු ලබන තනතුර සටහන් කළ යුතුය

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

2026 සැප්තැම්බර් මස 11 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***මහනුවර මහා නගර සභාවේ මහජනාධාර දෙපාර්තමේන්තුව සඳහා***
***ඉංග්‍රීසි මාධ්‍ය පෙර පාසල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීම***

01. අයදුම්කරු අයත්වන පළාත් පාලන ආයතනය : ..............................................................................

02. (අ) මුලකුරු සමඟ නම ( සිංහලෙන්) : ..............................................................................

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) : ..............................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : .......................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. උපන් දිනය වර්ෂය : ...................මාසය :.................... දිනය :....................

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2026.10.02 දිනට) වයසඃ අවුරුදු : ..................මාස : .................. දින :...................

06. ස්ත්‍රී පුරුෂ භාවය : ..................................................................................

07. විවාහක / අවිවාහක භාවය : ..................................................................................

08. ස්ථිර ලිපිනය : ..................................................................................

09. දුරකථන අංකය : ..................................................................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? : ..................................................................................

එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? යන බව :..........................................................................

11. අධ්‍යාපන සුදුසුකම් :

11. (I) අ.පො.ස.( සාමාන්‍ය පෙළ) විභාගය

වර්ෂය : ....................
විභාග අංකය : ....................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11. (II) අ.පො.ස. (උසස් පෙළ) විභාගය

වර්ෂය : ....................
විභාග අංකය : ....................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

11. ඩිප්ලෝමා පිළිබඳ තොරතුරු ..........................................................................................................................
..........................................................................................................................

12. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :

..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

13. අයදුම්කරුගේ සහතිකය:

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත්කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් පැහැදිලිව දනිමි.

........................
අයදුම්කරුගේ අත්සන.

දිනය :........................

09-98